කවර හෝ කාන්තාවක් ඇයගේ භාරකරුවාගේ අනුමැතියෙන් තොරව විවාහ වූවා ද ඇයගේ විවාහය වලංගු නැත යැයි තුන්වරක් පවසා, ඇය සමග පහස විද ඇති බැවින් ඇයට පිරිනමන ලද විවාහ ත්යාගය ඇය සතු වේ. භාරකරුවන් ගැටලු ඇති කර ගත්තේ නම් භාරකරුවකු නොමැති වන අයට භාරකරු වනුයේ පාලකයා ය

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව දේවත්වය විශ්වාස කරන්නන්ගේ මෑණියක වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී:
"කවර හෝ කාන්තාවක් ඇයගේ භාරකරුවාගේ අනුමැතියෙන් තොරව විවාහ වූවා ද ඇයගේ
විවාහය වලංගු නැත යැයි තුන්වරක් පවසා, ඇය සමග පහස විද ඇති බැවින් ඇයට පිරිනමන ලද
විවාහ ත්යාගය ඇය සතු වේ. භාරකරුවන් ගැටලු ඇති කර ගත්තේ නම් භාරකරුවකු නොමැති වන
අයට භාරකරු වනුයේ පාලකයා ය." [صحيح] [رواه أبو داود والترمذي وابن ماجه وأحمد]

කාන්තාවක් ඇගේ භාරකරුවන්ගේ අනුමැතියෙන් තොරව විවාහ වීම නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ අවවාද කළහ. සැබැවින්ම ඇගේ විවාහය වලංගු වන්නේ නැත. මෙය එතුමාණෝ තුන්වරක් පවසා සිටියහ. එය සිදු නොවිය යුත්තක් විය. ඇගේ භාරකරුගේ අවසරයෙන් තොරව විවාහ කරගත් අයකු ඇය සමග පහස විඳ තිබේ නම්, ඇගේ යෝනි මාර්ගය හරහා සංසර්ගයේ නිරත වීම හේතුවෙන් මුළු මහර් ප්රමාණයම ඇය සතු විය යුතුය. විවාහ ගිවිසුමේ භාරකාරත්වය ගැන සම භාරකරුවන් අතර ගැටලු ඇති වී නම්, ඇගේ යහපත නිරීක්ෂණය කරමින් ඔවුන් අතරින් පෙරටුගාමියකු හට ගිවිසුමේ වගකීම පැවරේ. එසේ භාරකරු ඇයව විවාහ කර දීමෙන් වැළකී සිටියේ නම්, ඇය භාරකරුවකු නොමැති තැනැත්තියක් මෙනි. එවිට පාලකයා හෝ කාදිවරයා හෝ ඔවුන් මෙන් කටයුතු භාරව කටයුතු කරන්නකු ඒ සඳහා ඉදිරිපත් විය යුතුය. මෙවැනි තත්ත්වයක් නොවී නම්, භාරකරුවකු සිටිය දී පාලකයාට ඇයගේ භාරකරුවකු විය නො හැක.

https://sunnah.global/hadeeth/si/show/58067